**ශීර්ෂය 9 – පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය, පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 9 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජුනි 08 දින අධිකාරයේ සභාපති වෙත නිකුත් කරන ලදී. ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය

මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.5 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | අයි ප්‍රතිපාදන සලසා ගැනීම<br><br>කාර්ය මණ්ඩලය පුහුණු කිරීම ප්‍රමාණවත් නොවීම | 2.4<br><br>2.5 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | ලැබී තිබුණු අභියාචනා සුදුස්සක් කර අවසන් කිරීමට නොහැකි වීම | 2.2 |

| | | | |
|---|---|---|---|
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකාරය සලසා තිබීම. | රජයේ තක්සේරුකරුගේ කුලිය ඉක්මවා ගොඩනැගිලි කුලී ගෙවීම | 2.3 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 2.1 අධිකාරයේ ප්‍රධාන කාර්යභාරයන්

--------------------------------------

රාජ්‍ය නිලධාරීන් හා පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් දෙනු ලබන තීරණයන්ට සහ නියමයන්ට එරෙහිව ගොනු කරනු ලබන අභියාචන විමර්ශනය කර විනිශ්චයක් ලබා දීම.

### 2.2 ලැබී තිබුණු අභියාචනා සුදුස්සක් කර අවසන් කිරීමට නොහැකි වීම

--------------------------------------------------------------------------

2017 වර්ෂය ආරම්භයේදී අභියාචනා 746 ක් සුදුස්සක් කර අවසන් කළ යුතුව පැවැතුණි. සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු අභියාචනා 415 ක් සමඟ මුළු අභියාචනා 1161 ක් සුදුස්සක් කර අවසන් කළ යුතුව තිබුණි. නමුත් වර්ෂය අවසාන වන විට ඉන් අභියාචනා 208 ක් පමණක් සුදුස්සක් කර අවසන් කර තිබුණි. ඒ අනුව වර්ෂය අවසාන වන විට අභියාචනා (නැවත කැඳවූ අභියාචන 05 හැර) 948 ක කටයුතු අවසන් කර නොතිබුණි. අභියාචනා විමසීම් කෙරෙන අධිකරණ ක්‍රියාවලියේ දී පැනනගින පාලනය කර ගත නොහැකි ප්‍රායෝගික තත්ත්වයන් නිසා ලැබී තිබුණු අභියාචනා නිශ්චිත කාල වකවානුවක් තුළ විමසා සුදුස්සක් කර අවසන් කිරිමට නොහැකි වි තිබුණු බව නිරීක්ෂණය විය.

### 2.3 රජයේ තක්සේරුකරුගේ කුලිය ඉක්මවා ගොඩනැගිලි කුලී ගෙවීම

-------------------------------------------------------------------------

2015 ජුනි 01 දින සිට වර්ෂ 03 ක දීර්ඝ කාල පරිච්ඡේදයක් සඳහා මාසිකව රු.600,000 ක කුලියක් ගෙවීමේ පදනම මත අධිකාරයේ කටයුතු ඉටු කිරිම සඳහා ගොඩනැගිල්ලක් ලබා ගෙන තිබුණි. මේ සඳහා ගෙවිය යුතු කුලිය පිළිබඳව රජයේ තක්සේරුකරුගෙන් විමසා තිබුණත්, රජයේ තක්සේරුකරු විසින් 2015 මැයි 05 දින වන විටත් අධිකාරය විසින් ගෙවිය යුතු කුලිය පිළිබඳ තොරතුරු එවා නොතිබුණි. අධිකාරයේ කටයුතු ඉටු කිරීම හදිසි අවස්ථාවක් ලෙස සලකා රජයේ තක්සේරුකරුගේ තක්සේරු කුලිය පදනම් කර ගැනීමට හැකිවන පරිදි ගොඩනැගිල්ල කුලියට ගැනීමට 2015 මැයි 06 දිනැති ලිපියෙන් ජනාධිපති ලේකම්වරයා විසින් අනුමැතිය ලබා දී තිබුණි. 2016 ජනවාරි 12 දින රජයේ තක්සේරුකරු එහි මාසික කුලිය රු.350,000 ක් ලෙස දන්වා එවා

තිබුණි. ජනාධිපති ලේකම්වරයාගේ ලිපියේ සඳහන් කොන්දේසිවලට අනුව කටයුතු නොකර වර්ෂ 03 ක් වැනි දීර්ඝ කාලයකට ගිවිසුම්වලට එළඹීම නිසා මාසයකට රු.350,000 ක රජයේ තක්සේරුකරුගේ කුලිය ඉක්මවා මාසයකට රු.600,000 බැගින් ගෙවීම සඳහා ගිවිසුම්වලට එළඹීම නිසා 2015 වර්ෂය සඳහා රු.1,750,000 කද, 2016 වර්ෂය සඳහා රු. 3,000,000 කද, 2017 වර්ෂය සඳහා රු.3,000,000 ක්ද වශයෙන් වැඩිපුර කුලියක් ගෙවා තිබුණි.

**2.4 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අධිකාරයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| **වර්ෂය** | **වියදම් වර්ගය** | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|---|
| | | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 2013 | පුනරාවර්තන | 17.07 | 13.57 | 3.50 | 20.50 |
| | මූලධන | 0.91 | 0.87 | 0.04 | 4.40 |
| | **එකතුව** | **17.98** | **14.44** | **3.54** | **19.69** |
| 2014 | පුනරාවර්තන | 16.62 | 14.62 | 2.00 | 12.03 |
| | මූලධන | 1.05 | 0.47 | 0.58 | 55.24 |
| | **එකතුව** | **17.67** | **15.09** | **2.58** | **14.60** |
| 2015 | පුනරාවර්තන | 23.13 | 22.92 | 0.21 | 0.91 |
| | මූලධන | 1.20 | 0.56 | 0.64 | 53.33 |
| | **එකතුව** | **24.33** | **23.48** | **0.85** | **3.49** |
| 2016 | පුනරාවර්තන | 22.20 | 21.19 | 1.01 | 4.55 |
| | මූලධන | 0.85 | 0.67 | 0.18 | 21.18 |
| | **එකතුව** | **23.05** | **21.86** | **1.19** | **5.16** |
| 2017 | පුනරාවර්තන | 23.50 | 23.04 | 0.46 | 1.96 |
| | මූලධන | 0.85 | 0.54 | 0.31 | 36.47 |
| | **එකතුව** | **24.35** | **23.58** | **0.77** | **3.16** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**අධිප්‍රතිපාදන සලසා ගැනීම**

**-----------------------------**

අධිකාරය විසින් සමාලෝචිත වර්ෂයේදී මූලධන වැය විෂයයන් දෙකක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 100 ක් හා සියයට 88 ක ප්‍රමාණයක් වී තිබුණි.

## 2.5 මානව සම්පත් කළමනාකරණය

**---------------------------------**

**අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

**-------------------------------------------------------------------------------------**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අධිකාරය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 10.80 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 02 | 02 | - |
| (ii) | තෘතියික මට්ටම | 04 | 01 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 17 | 11 | 06 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 08 | 07 | 01 |
| | **එකතුව** | **31** | **21** | **10** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**කාර්ය මණ්ඩලය පුහුණු කිරීම ප්‍රමාණවත් නොවීම**

**--------------------------------------------------**

කාර්ය මණ්ඩලය නිතිපතා පුහුණු කිරීමේ අවශ්‍යතාවක් තිබුණත්, අධිකාරය විසින් ඒ කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. පසුගිය වර්ෂ 05 ක කාලය තුළදී එකතුව රු.290,000 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, ඉන් රු.13,500 ක් පමණක් උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.50,000 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, ඉන් නිලධාරීන් තිදෙනෙකු පමණක් පුහුණු කිරීමට රු.6,000 ක් වැය කර තිබුණි.